# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය　இணைந்த சேவைகள் பிரிவு　COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.　சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.　Independence Square, Colombo 07, Sri Lanka

| දුරකතනය<br>தொலைபேசி: (94) 011- 2694560<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்: (94) 011- 2692254<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்: dgcs@pubad.gov.lk<br>E-mail | වෙබ් අඩවිය<br>இணைத்தளம்: www.pubad.gov.lk<br>Web Site |
|---|---|---|---|


| මගේ අංකය<br>எனது இல<br>My No | CS/DOS/05/03/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2016.06.10 |
|---|---|---|---|---|---|

**සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්/**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**

**දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,**

**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සහන ලබා දීම - සංවර්ධන නිලධාරි සේවය.</u>**

යථෝක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2016 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව වර්ෂයකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්විය යුතු වුවත් දැනට එක් විභාගයක් පමණක් පවත්වා ඇති බැවින් ඉහත චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව තවදුරටත් සමාන අනුගාමී විභාග අවස්ථා 05ක් සංවර්ධන නිලධාරීන් සඳහා ලබා දිය යුතුව පවතී.

03. ඒ අනුව, එම විභාග අවස්ථා ඇතුලත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමෙන් පසුව පමණක් ඒ සඳහා සහන කාලයක් ලබා ගැනීම සම්බන්ධයෙන් වන ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2011 (i) මගින් සංශෝධිත EC (EST 7) ආකෘති පත්‍රය ප්‍රකාරව මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

04. සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සහන කාලයක් ලබා ගැනීමට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මගින් මේ වන විට ඉල්ලීම් ලැබෙමින් පවතින බැවින් ඉහත සඳහන් පරිදි කටයුතු කිරීමට අදාල සියලු නිලධාරීන් දැනුවත් කරන මෙන්ද වැඩිදුරටත් දැනුම් දෙමි.

**කේ.වී.පී.එම්.ජේ.ගමගේ**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

සංවර්ධන නිලධාරින් සම්බන්ධ ලිපි යොමු කිරීමේදී අදාල නිලධාරියාගේ පත්වීම් ලිපි අංකය(CS/DOS/XXXXX) සඳහන් කිරීමට කාරුණික වන්න.